**ශීර්ෂ 101- බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා බුද්ධශාසන අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

## 1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු

| ශීර්ෂ | දෙපාර්තමේන්තුව |
|---|---|
| 201 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව |
| 202 | මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුව |
| 203 | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව |
| 204 | හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව |
| 205 | මහා භාරකාර දෙපාර්තමේන්තුව |

## 1.1 විගණන විෂය පථය

ඉහත 1 ඡේදයේ සඳහන් බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවල 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තා පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට හා ගණන්දීමේ නිලධාරීන් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| ශීර්ෂ | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය |
|---|---|---|
| ----- | ---------------------------------- | ------------------------ |
| 101 | බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය | 2015.07.17 |
| 201 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 2015.06.30 |
| 202 | මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 2015.07.14 |
| 203 | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | 2015.07.08 |
| 204 | හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 2015.07.16 |
| 205 | මහා භාරකාර දෙපාර්තමේන්තුව | 2015.07.22 |

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 5 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 2,005.1 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,942.0 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.මිලියන 0.3 ත් රු.මිලියන 32.4 ත් අතර පරාසයක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.8 ක සිට සියයට 15.2 ක පරාසයක ප්‍රමාණයකින් පැවැතුණි**.** විස්තර පහත දැක්වේ.

| ශීර්ෂ | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 101 | 665.1 | 654.9 | 10.2 | 1.5 |
| 201 | 846.5 | 814.1 | 32.4 | 3.8 |
| 202 | 91.7 | 77.8 | 13.9 | 15.2 |
| 203 | 148.6 | 144.9 | 3.7 | 2.5 |
| 204 | 214.8 | 212.2 | 2.6 | 1.2 |
| 205 | 38.4 | 38.1 | 0.3 | 0.8 |
| **එකතුව** | **2,005.1** | **1,942.0** | **63.1** | **3.1** |

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 5 ට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 10101 | 8.0 | 5.9 | 1.9 | 4.3 | 22.0 | 12.7 |
| 20101 | 20.0 | 19.9 | 10.0 | 12.8 | 55.0 | 40.5 |
| 20201 | 2.0 | 1.8 | 0.9 | 1.3 | 12.0 | 6.5 |
| 20301 | 1.5 | 1.2 | 0.5 | 0.6 | 8.5 | 2.9 |
| 20401 | 0.4 | 4.0 | 1.8 | 3.0 | 11.5 | 8.4 |
| 20501 | 3.0 | 1.7 | 1.3 | 1.5 | 11.0 | 7.6 |

## 2.3 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු පහෙන් 04 ක 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂවල එකතුව රු.මිලියන 50.363 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය | 7002/0000/00/0209/0014/000 | 2,932,293 |
| මුස්ලිම් කටයුතු දෙපාර්තමේන්තුව | 7002/0000/00/0135/0013/000 | 37,034,714 |
| | 7002/0000/00/0135/0014/000 | 4,204,483 |
| ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුව | 7002/0000/00/0404/0014/000 | 1,191 |
| මහා භාරකාර දෙපාර්තමේන්තුව | 7002/0000/00/0141/0014/000 | 6191,253 |
| **එකතුව** | | **50,363,934** |

## 2.4 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 5 ක 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 68.9 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය | 6000/0000/00/0015/0015/000 | 47,478,818 |
| බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0083/000 | 4,890,085 |
| මුස්ලිම් කටයුතු දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0084/000 | 16,422,508 |
| ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0085/000 | 3,150 |
| හින්දු ආගමික හා සංස්කෘතික දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0086/000 | 121,681 |
| මහා භාරකාර දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0087/000 | 8,090 |
| **එකතුව** | | **68,924,332** |

## 2.5 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ හා එම අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවල විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල

කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

## 3. ශීර්ෂ 101 - බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය

### 3.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| (i) විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| (ii) හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |

### 3.2 විගණන විමසුම්වලට පිළිතුරුදීම

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුමකට 2015 ජුනි 15 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

### 3.3 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 35 ක සිට සියයට 82 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) වැය විෂයයන් 22 ක් සඳහා සළසා තිබුණු රු.302,216,478 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.331,747,506 ක් උපයෝජනයන් කළ පසු රු.331,784 ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය රු.29,523,352 කින් ඉක්මවා රු.29,855,136 ක බැරකම්වලට එළඹ තිබුණි.

### 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

විෂය අංක 10101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.209,881 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 02 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**3.5** **අභ්‍යන්තර විගණනය**

ක්ෂේත්‍ර 33 ක් ආවරණය වන පරිදි අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු 5 ක් සඳහා අභ්‍යන්තර විගණනය සැලැසුම් සකස් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් 2 ක් පමණක් සිදු කර තිබුණි. අමාත්‍යාංශය විසින් මෙහෙයවන ව්‍යාපෘති හෝ සංවර්ධන කටයුතු පිළිබඳව කිසිදු අභ්‍යන්තර විගණන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.

**3.6** **බේරුම් නොකළ බැරකම්**

අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයකට අඩු කාලයක සිට පැවත එන බැරකම්වල එකතුව රු.29,862,814 ක් විය.

**3.7** **අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානයන්ට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 103 (1) හා 104 | 55,260 | අමාත්‍යාංශය සතු වාහන දෙකකට සිදු වූ අනතුරු දෙකක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 751(1) හා 751(2) | 18,564,224 | පිටිසර දේවාල 32 ක් සඳහා නිර්මාණය කළ වාර්තා චිත්‍රපටවල සීඩී තැටි බඩු ලේඛන පොතෙහි ඇතුළත් කර නොතිබුණි.<br>සීඩී තැටි සඳහා නිකුත් කිරීමේ නියෝග හා ලැබීම් නියෝග නිකුත් කර නොතිබුණි.<br>“දැහැමි නිවහනයි අපේකම රැදි |

| | | | |
|---|---|---|---|
| | | | හෙට දිනයි" අත්පොත් 39,000 ක් හා පිටිසර දේවාල සඳහා නිෂ්පාදනය කළ ඩීවීඩී තැටි 96 ක් ලේඛනගත කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 1647(ආ) | | මෝටර් රථයක් භාරව සිටි රියදුරන් අවස්ථා 3 කදී වෙනස් කර තිබුණද රියදුරන් වෙනස් වන විටදී වාහන උපකරණ පිළිබඳ සමීක්ෂණය සිදුකර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 395 (ඇ) | | 2014 වර්ෂයේ බැංකු සැසඳුම් ප්‍රකාශන කාල ප්‍රමාදයකින් පසුව 2015 මැයි 15 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 1646 | | අමාත්‍යාංශය සතු සංචිත වාහන 09 කට අදාල දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා 2015 ජුලි 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| | 2006 ජුලි 14 දිනැති අංක 11/2006 දරන චක්‍රලේඛයේ 3(vii) ඡේදය | 125,690 | විශේෂ අවස්ථාවකදී අදාල ලේකම්වරයාගේ අනුමැතිය මත අතිරේක ඉන්ධන නිකුත් කළ හැකි වුවත් අමාත්‍යාංශයේ වාහනයකට 2014 වර්ෂයේ මාස 06 කදී සෑම මාසයකටම අතිරේක ඉන්ධන ලබාදී තිබුණි. |

**3.8** **කාර්යසාධනය**

------------------

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම් (අරමුණින් බැහැරවීම් යනාදිය)**

**---------------------------------------------------------------------------**

නේපාලයේ ලුම්බිනි නුවර ස්ථාපිත දුටු ගැමුණු විශ්‍රාම ශාලාව ඉදිකිරීමේ කටයුතු 2014 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණද, එම විශ්‍රාම ශාලාව නිම කිරීමට සමාලෝචිත වර්ෂයේ රු.53,198,264 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි.

**3.9** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

----------------------------------

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ වූ අතර එවැනි ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

**(අ)** **"දැහැමි නිවහනයි - අපේකම රැදි හෙට දිනයි" අත්පොත මුද්‍රණය කිරීම**

**---------------------------------------------------------------------------**

බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් 2013 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2014 අගෝස්තු 10 වන දින දක්වා "දැහැමි නිවහනයි - අපේකම රැදි හෙට දිනයි" වැඩසටහන වෙනුවෙන් මුද්‍රණය කළ අත්පොතක් වෙනුවෙන් අවස්ථා 03 කදී රු.4,790,000 ක් පෞද්ගලික මුද්‍රණ ආයතනයකට ගෙවා තිබුණි. ඒ පිළිබඳ සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ජාතික වශයෙන් තරඟකාරී ලංසු කැඳවා නොතිබුණු අතර, 4.3 මාර්ගෝපදේශය ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුව පිළියෙල කර නොතිබුණි.

(ii) “දැහැමි නිවහනයි අපේකම රැදි හෙට දිනයි” අත්පොත රජයේ මුද්‍රණාලයෙන් මුද්‍රණය කර නොගැනීමෙන් රජයට රු. 3,049,000 ක පාඩුවක් සිදුවී තිබුණි.

**(ආ)** **"දැහැමි නිවහනයි අපේකම රැදි හෙට දිනයි" වැඩසටහන ජාතික වැඩපිළිවෙලක් ලෙස ජනමාධ්‍ය මඟින් සමාජගත කිරීමේ ව්‍යාපෘතිය**

**------------------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියට අදාලව මාර්ගෝපදේශ සංයුක්ත තැටිය නිර්මාණය කිරීම, තේමා ගීතය නිර්මාණය කිරීම, ටෙලිපූරක 35 ක් නිර්මාණය කිරීම යන කාර්යයන් 03 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදි සේවා සැපයුම්කරුවන්ට රු.20,670,000 ක් ගෙවා තිබුණු අතර

එම ගෙවීම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) මුදල් රෙගුලාසි 36 ප්‍රකාරව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) 2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදන සළසා ගැනීමට කටයුතු කර නොතිබුණි. 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට හා ප්‍රසම්පාදන සැලැස්මට මෙම කාර්යයන් ඇතුළත් කර නොතිබුණි.

(iii) ව්‍යාපෘතියේ මූලික අරමුණ ජාතික වැඩසටහනක් ලෙස ජනමාධ්‍ය භාවිතා කරමින් "දැහැමි නිවහනයි අපේකම රැදි හෙට දිනයි" යන වැඩසටහන සමාජගත කිරීම වුවද, සේවාවන් ලබාදුන් ආයතන විසින් අමාත්‍යාංශයට භාරදුන් DVD තැටි ජනමාධ්‍ය හරහා සමාජගත කරනු වෙනුවට අමාත්‍යාංශය තුළ රඳවාගෙන තිබීම නිසා ව්‍යාපෘතියේ අරමුණු ඉටුවී නොතිබුණි.

## (ඇ) පිටිසර දේවාල 32 කට වාර්තා චිත්‍රපට නිර්මාණය කිරීම

පිටිසර දේවාල 32 කට වාර්තා චිත්‍රපට නිර්මාණය කිරීම වෙනුවෙන් 2013 හා 2014 වර්ෂවලදී අමාත්‍යාංශය විසින් රු.18,564,224 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 2014 වර්ෂය වෙනුවෙන් පූජා භූමි සංවර්ධනය කිරීම සඳහා 101-2-6-1-2502 වැය විෂය යටතේ රු.138,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. එම ප්‍රතිපාදන උපයෝගී කරගෙන පිටිසර දේවාල 32 ක වාර්තා චිත්‍රපටි නිෂ්පාදනය සඳහා රු.15,247,224 ක් වැය කර තිබුණි.

(ii) මේ සඳහා 2013 වර්ෂයේදී ආයතන 03 කට අත්තිකාරම් වශයෙන් රු.3,317,000 ගෙවා තිබුණු අතර එම අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කිරීමේදි පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. මේ සඳහා සමාලෝචිත වර්ෂයේ සිදු කර තිබුණු රු.14,247,224 ක වියදම මූලධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයන ව්‍යාපෘති සඳහා ජාතික වශයෙන් තරඟකාරී ලංසු කැඳවීම සිදු කළ යුතු වුවත්, පදනම් රහිතව ව්‍යාපෘතිය කොටස්වලට

වෙන්කර සැපයුම් කරුවන් 07 ක ගෙන් පමණක් මිල ගණන් කැඳවා සැපයීම් සිදු කර තිබුණි.

(iv) මෙම CD නිෂ්පාදනය කිරීමේ ප්‍රධාන අරමුණ පැරණි වෙහෙර විහාර හා ඒවායේ චාරිත්‍ර විධි සංරක්ෂණය කිරීම ලෙස දක්වා තිබුණද, ඒ සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි. විගණන දිනය වූ 2015 ජනවාරි 20 දින වන විටත් මෙම CD අමාත්‍යාංශය භාරයේ රඳවා ගෙන තිබුණි .

## 3.10 අවිධිමත් ගනුදෙනු

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) "2600 Year of Sambuddhathva" නම් ග්‍රන්ථය මුද්‍රණය කිරීම.

2600 සම්බුද්ධත්ව ජයන්තිය නිමිති කොට ගෙන "2600 Year of Sambuddhathva" නම් ග්‍රන්ථයෙන් පිටපත් 2,000 ක් මුද්‍රණය කිරීමට අමාත්‍යාංශය හා බුද්ධශාසන අරමුදල විසින් එකතුව රු.4,053,000 ක් ගෙවා තිබුණද, මෙම මුද්‍රණ කටයුත්තේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 මාර්ගෝපදේශය ප්‍රකාරව පිරිවැය ඇස්තමේන්තු සකස් කර නොතිබුණි. තවද මුද්‍රණය කර අමාත්‍යාංශය වෙත භාර දී තිබුණු පොත් මුදල් රෙගුලාසි 454 හා 751 ප්‍රකාරව තොග ලේඛනවල සටහන් කර නොතිබුණි. පොතක පිරිවැය රු.3,203 ක් වී තිබුණද රු.5,000 ක් ලෙස පොතක මිල ලකුණු කර තිබුණි. එසේම පොත් විකිණීම සඳහා විධිමත් වැඩපිළිවෙලකින් තොරව මුද්‍රණය කර තිබීම හේතුවෙන්, ඉතිරි වී තිබූණු රු. 5,172,845 ක් පිරිවැය වූ පොත් 1615 ක ප්‍රමාණය බුද්ධශාසන අරමුදලට භාර දී තිබුණි.

### (ආ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු

අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සංවර්ධන) ධුරයට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු පත්කරන දින හෝ 2012 දෙසැම්බර් 31 දින හෝ යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා පමණක් වලංගු වන පරිදි අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ I ශ්‍රේණියේ නිලධාරියකු ඉහත ධුරයට 2010 ජූලි 07 දින අමාත්‍ය මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්ව පත්කර තිබුණි. මෙම පත්වීම 2012 දෙසැම්බර් 31 දින අවසන් විය යුතු වුවත්, එදිනෙන් පසුවද 2014 දෙසැම්බර් 05 දින දක්වා එම නිලධාරියාට රු.1,094,075 ක වැටුප් විධිමත් අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

## 3.11 විසඳා නොතිබුණු විගණන ඡේද

අමාත්‍යාංශයට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු පසු විපරම් කටයුතු නිම නොකළ ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2012 | 9.1 | අවශ්‍යතාවය හා සවිකළ යුතු කැමරා ප්‍රමාණය පිළිබඳ පූර්ව විනිශ්චයකින් තොරව අමාත්‍යාංශ පරිශ්‍රය සඳහා රු.1,111,500 ක් වැය කර CCTV කැමරා පද්ධතියක් සවිකර තිබුණි. |
| 2012 | 9.2 | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව දහම්පාය ගොඩනැගිල්ල සඳහා රු.27,198,047 ක් වටිනා ලී බඩු හා කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණු අතර ඒ වෙනුවෙන් උපදේශක ගාස්තු ලෙස රු.1,474,994 ක් ගෙවා තිබුණි. ඉන් රු.4,561,696 ක වටිනාකමකින් යුත් භාණ්ඩ නියමිත ප්‍රමිතියෙන් යුක්ත නොවූ අතර දිගුකාලීන පාවිච්චියටද නුසුදුසු ඒවා විය. |
| 2012 | 9.3 | දහම්පාය ගොඩනැගිල්ලෙහි අභ්‍යන්තර අලංකරණය හා සැලැසුම් කිරීමේ කාර්යය වෙනුවෙන් වූ කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 2.8 ක් ගෙවීමේ පදනම මත පත් කරනු ලැබූ උපදේශක සමාගමට තම වගකීම නිසි පරිදි ඉටු නොකිරීම, අවිධිමත් පරිදි කටයුතු කිරීම, සේවා ගිවිසුම් කොන්දේසි කඩකිරීම වැනි දුර්වලතා තිබියදීත් රු.1,474,994 ක් ගෙවා තිබුණි. |
| 2012 | 10.1 | අමාත්‍යාංශය විසින් රු.653,773 ක් වැයකර විදේශ රටක් මඟින් පරිත්‍යාග කළ පරිගණක යන්ත්‍ර 298 ක් ලබා ගෙන තිබූ අතර ඒවා කිසිදු සැලැසුමකින් හෝ ලබාදුන් බව සහතික කරගැනීමෙන් තොරව විවිධ පුද්ගලයන්, ආයතන හා සංවිධාන වෙත බෙදා හැර තිබුණි. |
| 2012 | 10.3 | ශ්‍රී ලංකාවට වැඩම කළ කපිලවස්තුපුර ශ්‍රී සර්වඥ ධාතූන් වහන්සේලා ප්‍රදර්ශනය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් රු.මිලියන 15 ක වියදමක් දරා තිබුණු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට |

| | | |
|---|---|---|
| | | පටහැනිව කුලී පදනම මත LED තිර සහ CCTV කැමරා සවිකර තිබුණි. |
| 2011<br>2012 | 9.1<br>9.4 | 2600 සම්බුද්ධත්ව ජයන්තියට සමගාමීව අමාත්‍යාංශය විසින් රු.4,795,416 ක අනාර්ථික පිරිවැයක් දරමින් අනුරාධපුර ප්‍රදේශයේ පිවිසුම් මාර්ග හරහා ඉදිකළ තොරන් 5 ලේඛනගත කර නොතිබුණු අතර ගලවා ඉවත් කළ තොරන්වල තිබුණු යකඩ හා වෙනත් වටිනා ද්‍රව්‍ය විධිමත් පරිදි භාරගැනීමට හා ඉවත් කිරීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි. |
| 2012 | 10.5 | අමාත්‍යාංශය විසින් ත්‍යාග පිරිනැමීමට අභ්‍යාස පොත් 1100 ක් රු.110,000 කට මිලදී ගැනීමේදී වෙළඳ වට්ටම් ලබාගැනීමට අවධානය යොමු නොකිරීම හේතුවෙන් රු.11,000 ක පාඩුවක් රජයට සිදු වී තිබුණි. |
| 2011<br>2012 | 10<br>10.6 | අමාත්‍යාංශය විසින් නිශ්චිත අරමුණකින් තොරව රු.15,000,000 ක් වැය කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් සම්බුද්ධත්ව ජයන්ති සමරු කාසි 2000 ක් ටංකනය කරවා තිබුණි. 2014 මාර්තු 31 දිනට එම සමරු කාසිවලින් වටිනාකම රු.7,882,500 ක නොවිකිණී තිබුණු කාසි 1051 න් කාසි 1002 ක් මහ බැංකුව භාරයේ පැවතුණි. |

## 3.12 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2014 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 16 | 11 | 5 |
| (ii) | ද්විතියික මට්ටම | 2 | - | 2 |
| (iii) | තෘතියික මට්ටම | 139 | 75 | 64 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 37 | 26 | 11 |
| (v) | වෙනත්(අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 5 | 2 | 3 |
| | **එකතුව** | **199** | **114** | **85** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 85 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

## 4. ශීර්ෂ 201 - බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

## 4.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| (ඈ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| (ඉ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය |
| (ඊ) | ලංසු කැදවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය |

## 4.2 විසර්ජන ගිණුම

-----------------

### 4.2.1 අයවැය විචලනය

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27 ක සිට සියයට 77 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ පොත් අනුව 201-2-2-1405 වැය විෂයයේ වියදම් රු.29,392,924 ක් වූ අතර භාණ්ඩාගාර පොත් අනුව එය රු.28,392,924 ක් වී තිබුණි. මේ නිසා රු.1,000,000 ක වෙනසක් පැවැතුණි.

## 4.3 පොදු තැන්පත් ගිණුම

----------------------

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.323 277 ක තැන්පතු 5 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 4.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

------------------------------------------------------------------------

විෂය අංක 20101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය අනුව වර්ෂයකට වැඩි කාලයක සිට සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.42,150 ක ආපදා ණය ශේෂය 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

## 4.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

------------------------------------

### 4.5.1 අභ්‍යන්තර විගණනය

------------------------

විහාර හා දේවාලගම් පනතින් පාලනය වන විහාර හා දේවාලගම් සම්බන්ධයෙන් 2014 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් සිදු කර තිබුණු අභ්‍යන්තර විගණන පරීක්ෂාවන්වලින් පෙන්වා දී තිබුණු අඩුපාඩු නිවැරදි කිරීමට දෙපාර්තමේන්තුව 2015 මැයි 30 දිනටත් අපොහොසත් වී තිබුණි. එම අභ්‍යන්තර විගණන පරීක්ෂාවන්ට අනුව,

(අ) ප්‍රමාණවත් පරිදි පොත් පත් හා ලේඛන පවත්වා නොතිබීම නිසා විහාර හා දේවාලගම් සතු වත්කම් නිවැරදිව තහවුරු කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන වාර්තා මඟින් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කළ යුතු බව අදාල පාර්ශවයන් වෙත දන්වා තිබුණත්, ඒවා ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳ නිශ්චිත උපදෙස් ලබා දී නොතිබුණි.

**4.6 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

2014 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දුන් විකිණිය යුතු හා ඉවත් කළ යුතු භාණ්ඩ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 772(1) පරිදි 2015 මැයි 30 දින වන විටත් දෙපාර්තමේන්තුව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට වසරකට අඩු කාලයක සිට පැවැත එන බේරුම් නොකළ රු.154,806,824 ක්වූ බැරකම් විය.

**4.7 කාර්යසාධනය**

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණයක් පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

1931 අංක 19 දරන විහාර දේවාලගම් අඥාපනත ක්‍රියාත්මක කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් ලෙස දක්වා තිබුණද පනතේ 43 වගන්තිය සඳහා නිකුත් කර තිබුණු රෙගුලාසිවලට අනුව විහාරස්ථාන හා දේවාලවල ආදායමෙන් රජයට අයවිය යුතු සියයට 7.5 ක බදු මුදල් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**4.8 පාඩු හා හානි**

දහම් පාසල් ගුරුවරියන්ගේ ප්‍රයෝජනය සඳහා දේශීයව නිපදවන ලද අත්යන්ත්‍ර සාරි 60,000ක් මිලදී ගැනීමට බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් සහ රජයේ සමාගමක

සාමාන්‍යාධිකාරීවරයෙකු අතර ගිවිසුමකට 2012 මැයි 23 දින එළැඹ තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ ප්‍රසම්පාදන තීරණයක් අනුව දේශීය අත්‍යන්ත්‍ර සාරි 60,000 ක් එකක් රු.1,095 බැගින් (එකතුකළ අගය මත බද්ද රහිතව) රු.65,700,000 කට මිලදී ගැනීමට උක්ත ගිවිසුමේ 6 ඡේදය ප්‍රකාරව එකඟ වී තිබුණි. නමුත් රජයේ සමාගම විසින් දේශීය සැපයුම්කරුවෙකු හරහා ඉන්දියාවෙන් සාරි රෙදි ආනයනය කර සාරි සැපයීම සිදු කර තිබුණි. දෙපාර්තමේන්තුව විසින් සාරි 60,000 ක් වෙනුවෙන් එක් සාරියකට රු.1,226.40 ක් බැගින් රු.73,584,000 ක් සළුසල ආයතනයට ගෙවා තිබුණි.

මෙහිදී දේශීය සැපයුම්කරුට එක් සාරියක පිරිවැය රු.648.45 ක් වුවද රජයේ සමාගම විසින් දේශීය සැපයුම්කරුහට එක් සාරියකට රු.1,020 බැගින් ගෙවා තිබීම හේතුවෙන් එක් සාරියකින් රු.371.55 බැගින් සාරි 60,000 ක් සඳහා රු.22,293,000 ඇස්තමේන්තු ගත අලාභයක් සිදු වී තිබුණි.

(ආ) 2013/2014 වර්ෂ සඳහා දේශීය අත්‍යන්ත්‍ර සාරි 40,000 ක් සැපයීම සඳහා වූ ඇණවුමක් එම රජයේ සමාගම වෙත ලබාදී තිබුණි. ඒ සඳහා වූ ගිවිසුමේ 06 ඡේදය හා තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාවේ 04 ඡේදය ප්‍රකාරව දේශීයව නිෂ්පාදනය කරණ අත්‍යන්ත්‍ර සාරි සඳහා පමණක් එක් සාරියකට රු.1,400 බැගින් (බදු රහිත) සාරි 40,000 ක් සඳහා රු.56,000,000 ගෙවීමට නිර්දේශ කර තිබියදී ආනයනික සාරි සඳහා රජයේ සමාගම වෙත රු.39,767,000 ක් ගෙවා තිබුණි.

මෙම ඇණවුම සඳහාද සාරි සැපයීම දේශීය ආනයනකරුවෙකු හරහා සාරි රෙදි සපයා ගැනීමේදී රජයේ සමාගම විසින් සාරි ලෙස කැබලි කර ඇණවුමට අදාල සාරි ලබා දී තිබුණු බව නිරීක්ෂණය විය. මෙම සැපයුමට අදාලව බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව විසින් පත් කරණ ලද තාක්ෂණ ඇගයීම් කමිටුවේ 2014 අප්‍රේල් 01 දින වාර්තාවේ 05 ඡේදය අනුව ආනයනික රෙදිවලින් සාරි සැපයීම සිදු කරන්නේ නම් උපරිම මිල රු.1,000 ක් ලෙස දක්වා තිබුණද, රජයේ සමාගම විසින් දේශීය සැපයුම්කරු වෙත ආනයනික රෙදිවලින් නිෂ්පාදනය කරන ලද එක් සාරියක් සඳහා රු.1,305 බැගින් ගෙවා තිබුණු අතර ඒ අනුව එක් සාරියකින් රු.305 බැගින් සාරි 25,500 ක් සඳහා රු. 7,777,500 ක ඇස්තමේන්තුගත අලාභයක් සිදු වී තිබුණි.

## 4.9 කළමනාකරණ දූර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

### (අ) දහම් සරසවිය තුන්වන අදියර - 2013

දහම් සරසවිය තුන්වන අදියර සඳහා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයට රු.2,116,584 ක් 2013 හා 2014 වර්ෂවලදී ගෙවා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) දහම් සරසවිය තුන්වන අදියර යටතේ බුද්ධ ධර්ම ඩිප්ලෝමා පාඨමාලාව විධිමත් ගිවිසුමකට එළඹීමෙන් තොරව පාලි හා බෞද්ධ විශ්ව විද්‍යාලය විසින් ආරම්භ කර තිබුණු අතර ඒ සඳහා ඇස්තමේන්තුගත ශිෂ්‍ය සංඛ්‍යාව 2,500 ක් වුවද සත්‍ය වශයෙන් ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 1,556 ක් වූ බැවින් ප්‍රතිපාදන මුදා හැරීමේදී සත්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ සැලකිලිමත් වී නොතිබුණි.

(ii) පාඨමාලාවට අදාල සම්මන්ත්‍රණ නොපවත්වා රු.105,000 ක් වැයකර නිබන්ධන ග්‍රන්ථ 200 ක් මුද්‍රණය කර සිසුන් අතර බෙදා දී තිබුණි. මෙම නිබන්ධනවල පිරිවැය සිසුන්ගෙන් අයකර ගැනීමට හෝ, අනාගතයේදී පාඨමාලාව හදාරන සිසුන්ට බෙදා දිය හැකි පරිදි ආපසු ලබාගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

### (ආ) දෙමළ මාධ්‍ය දහම් පාසල් පොත් මුද්‍රණය.

දෙමළ මාධ්‍ය දහම් පාසල් පොත් මුද්‍රණය සම්බන්ධයෙන් කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 1 ශ්‍රේණිය දෙමළ මාධ්‍ය පෙළ පොතේ පළමු මුද්‍රණයේ පිටපත් 1,000 කින් පිටපත් 950 ක් බෙදාහැරීමට වර්ෂ 4ක කාලයක් ගතවී තිබුණි. නැවත 1 ශ්‍රේණිය දෙමළ මාධ්‍ය පොත් 2000 ක් රු. 86,000 ක වියදමින් මුද්‍රණය කර තිබුණු නමුත් 2014 දෙසැම්බර් 31 දින වන විටත් එම පොත් බෙදා හැරීමකින් තොරව රු.86,860 ක් වටිනා දෙමළ මාධ්‍ය පෙළ පොත් 2,020 ක ශේෂයක් පැවතුණි.

(ii) විධිමත් පරිදි මිල ඇස්තමේන්තුවක් ලබාගැනීමෙන් තොරව දහම් පාසල් 2 හා 3 වන ශ්‍රේණි සඳහා පෙළ පොත් පිටපත් 2,000 ක් මුද්‍රණය කර 2013 සැප්තැම්බර් 30 දිනට පෙර වේයන්ගොඩ පිහිටි දහම් පාසල් පොත් ගබඩාව වෙත භාරදෙන ලෙස රජයේ මුද්‍රණාලයාධිපති වෙත 2013 ජූනි 05 දින දන්වා තිබුණි. ඇණවුම් ලබා දී වසර 2 ක් ඉක්මවා තිබුණත්, එම මුද්‍රණයට අදාල කිසිදු පිටපතක් ගබඩාව වෙත 2014 දෙසැම්බර් 31 දින වන විටත් භාරදී නොතිබීම නිසා 1 ශ්‍රේණියේ දෙමළ මාධ්‍යයෙන් උගත් ළමුන්ට ඊළඟ ශ්‍රේණිය සඳහා දෙමළ මාධ්‍ය පොත් ලබා දීමට නොහැකිව තිබුණි.

## 4.10 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 03 | - |
| (ii) ද්විතියික මට්ටම | 10 | 09 | 01 |
| (iii) තෘතියික මට්ටම | 778 | 651 | 127 |
| (iv) ප්‍රාථමික මට්ටම | 36 | 27 | 9 |
| **එකතුව** | **827** | **690** | **137** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 137 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 5. ශීර්ෂ 202 - මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

---

### 5.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

---

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | පුද්ගල පඩිනඩි ලේඛනය | මුදල් රෙගුලාසි 453 |
| (ඈ) | ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය | මුදල් රෙගුලාසි 451 |
| (ඉ) | රාජකාරී දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) |
| (ඊ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| (උ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| (ඌ) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 |
| (එ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) |
| (ඒ) | ලංසු කැදවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය |

**5.2 විගණන විමසුම්වලට පිළිතුරු නොදීම**

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 6 කට 2015 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගනුදෙනුවල වටිනාකම රු.1,644,593 ක් විය.

**5.3 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 2 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27 ක සිට සියයට 92 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා සංස්කෘතික මධ්‍යස්ථානය ගොඩනැගීමට රු.190,430,318 ක මූලධන වියදම් කර තිබුණද, ස්ථාවර වත්කම් සංචලන වාර්තාවේ ගොඩනැගිලිවල ආරම්භක ශේෂය ලෙස එම වියදම ඉදිරියට ගෙනවිත් නොතිබුණි.

(ඇ) වර්ෂය තුළ අවස්ථා 2 ක දී වැය කරන ලද එකතුව රු.230,500 ක් වූ පුනරාවර්තන වියදම්, මූලධන වැය විෂයයන් යටතේ ගිණුම්ගත කර තිබුණි.

**5.4 පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.7,759,116 ක්වූ තැන්පතු 7 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**5.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 20201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිටව තිබුණු ශේෂවල එකතුව රු.475,319 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 1 සිට වර්ෂ 21 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව වැටුප් ණය හා අත්තිකාරම් වශයෙන් රු.1,772,545 ක් ගෙවා තිබුණු අතර දෙපාර්තමේන්තු සාමාජික ණය ලේඛන හා ණය ලෙජර අනුව එය රු.1,717,545 ක් වී තිබුණි. ඒ අනුව භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත හා දෙපාර්තමේන්තු පොත් අතර රු.55,000 ක වෙනසක් පැවැතුණි.

(ඇ) දෙපාර්තමේන්තු අත්තිකාරම් පාලන ගිණුම අනුව 2014 වර්ෂයේදී ගෙවූ උත්සව අත්තිකාරම් මුදලෙහි වටිනාකම රු.243,500 ක් වූ අතර දෙපාර්තමේන්තු සාමාජික ණය ලේඛණය හා අත්තිකාරම් ලේඛණ අනුව එම වටිනාකම රු.180,000 ක් වූයෙන් රු.63,500 ක වෙනසක් පැවැතුණි.

## 5.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 5.6.1 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

### 5.6.2 විගණන හා කළමනාකරණ කමිටුව

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පවත්වා නොතිබුණි.

## 5.7 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 වර්ෂයේදී සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්තතා හා ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 772 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයක අඩු කාලයක සිට පැවැත එන බැරකම් රු.6,639,556 ක් විය.

## 5.8 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| XXII පරිච්ඡේදයේ 23 .18 වගන්තිය | 196,288 | විදේශ ගතවූ නිලධාරියෙකුගේ විදේශ නිවාඩු පිළිබඳ විස්තර විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 1646 | - | දෙපාර්තමේන්තුවේ සංචිත වාහන 04 ක දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | |
| 2006 දෙසැම්බර් 26 දිනැති අංක PF/423 දරන චක්‍රලේඛයේ | | |
| 3 ඡේදය | | දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වන අරමුදල් 2 ක බැංකු ගිණුම් සම්බන්ධ කාර්තුමය වාර්තා සකස් කර රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත 2015 මැයි 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. |
| 4 ඡේදය | - | දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වන හජ් අරමුදල සහ මුස්ලිම් පුණ්‍යාධාර අරමුදල සඳහා 2014 වර්ෂයට අයවැය ලේඛණයක් පිළියෙල කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**5.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**(අ) බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේ දීර්ඝ ප්‍රමාදයන්**

මුස්ලිම් පුණ්‍යාධාර අරමුදලේ බැංකු ජංගම ගිණුම සඳහා 2014 අප්‍රේල් මාසයෙන් පසුව 2015 වර්ෂයේ මැයි මාසය දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි

**(ආ) ගැලපුම් කළයුතු ශේෂ**

මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශනවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ නිරික්ෂණයක් පහත දැක්වේ.

බැංකු ජංගම ගිණුම් 02 ක් වෙනුවෙන් 2014 දෙසැම්බර් මාසය වෙනුවෙන් පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොකළ මාස 06 ක් කල් ඉකුත් වූ පිළිවෙලින් රු.1,275,325 ක් හා රු.300,000 ක් වශයෙන් එකතුව රු.1,575,325 ක් වටිනා චෙක්පත් 185 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**5.10 අවිධිමත් ගනුදෙනු**

**අධිකාරී බලය නොමැති වූ ගනුදෙනු**

සවුදි ආරබියට විදේශ ගතවන මුස්ලිම් ජාතිකයින්, මුස්ලිම් ජාතිකයින් බව සනාථ කරමින් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන සහතිකයට රු.200 ක ගාස්තුවක් අයකර තිබුණි. 2014 මැයි 12 දිනැති අංක PFD/RED/10/03/2014/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය අනුව එම ආදායම 20.03.99.00 දරන ආදායම් සංකේතය යටතේ රාජ්‍ය ආදායමට බැර කිරිම සුදුසු බව නිර්දේශ කර තිබුණි. දෙපාර්තමේන්තුව විසින් එම නිර්දේශයට පටහැනිව 2014 ජුනි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා ලැබි තිබුණු එකතුව රු.738,000 ක ආදායම් අවිධිමත් ලෙස මුස්ලිම් පුණ්‍යාධාර අරමුදලට බැර කර තිබුණි.

**5.11 කළමනාකරණ දුර්වලතා**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ)** **මුස්ලිම් පුණ්‍යාධාර අරමුදල**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුස්ලිම් ආගමික කටයුතු අධ්‍යක්ෂ ඇතුළු වකුප් මණ්ඩලයේ සාමාජිකයන් 07 දෙනෙකු විසින් ගන්නා ලද තීරණ අනුව මුස්ලිම් පුණ්‍යාධාර අරමුදලට රු.10,362,256 ක ආදායම් රැස්කිරීම හා අරමුදලින් රු.9,611,915 ක් වියදම් කර තිබුණද, මේ සම්බන්ධයෙන් නිශ්චිත ප්‍රතිපත්තියක් හා විධිමත් ක්‍රමවේදයක්ද අනුගමනය කර නොතිබුණි.

(ii) දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඇතුළු 6 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් මඟින් අරමුදලේ පරිපාලන කටයුතු සිදුකර තිබූ අතර, විධිමත් පරිදි රාජකාරී පැවරීමක් සිදුකර නොතිබුණි. අරමුදලේ රාජකාරි ඉටු කළ දෙපාර්තමේන්තුවේ ස්ථිර නිලධාරීන් තිදෙනෙකු වෙත විධිමත් අනුමැතියකින් තොරව 2014 වර්ෂයේදී දීමනා ලෙස රු. 59,250 ක් ගෙවා තිබුණි.

(iii) දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, ගණකාධිකාරී හා නියෝජ්‍ය අධ්‍යක්ෂ යන තනතුරු දරන නිලධාරීන් සිටියදී, අරමුදලේ ආදායම් එකතු කිරීම, වියදම් කිරීම හා ගිණුම්කරණ කටයුතු සඳහා විධිමත් අනුමැතියක් ලබා නොගෙන හා විධිමත් පරිදි රාජකාරී පැවැරීමක්ද නොකර බාහිර සේවකයන් තිදෙනෙකු යොදවා මාසික දීමනා වශයෙන් එකතුව රු.38,000 ක් ගෙවා තිබුණි.

(iv) වකුෆ් පනතේ 43(8) වගන්තිය ප්‍රකාරව ගිණුම් පොත් විධිමත්ව පවත්වා ගැනීම හා ගිණුම් විගණනය කිරීම සම්බන්ධව කටයුතු කර නොතිබුණි.

**(ආ)** **හජ් අරමුදල**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 වර්ෂයේදී හජ් වන්දනා කරුවන්ගේ සුභසාධන කටයුතු සඳහා විදේශගත වූ දෙපාර්තමේන්තු නිලධාරීන් 5 දෙනෙකු වෙත එකතුව රු.350,000 ක දිරි දීමනාවක්ද, දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවකයන් දෙදෙනෙකුට හජ් සම්මුඛ පරීක්ෂණ දීමනා ලෙස රු.44,500 ක්ද, විධිමත් අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

(ii) හජ් අරමුදල සඳහා විධිමත්ව ගිණුම් සකස් කර නොතිබුණි.

**5.12** **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 6 | 3 | 3 | - |
| (ii) | ද්විතියික මට්ටම | 4 | - | 4 | - |
| (iii) | තෘතියික මට්ටම | 91 | 52 | 39 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 16 | 18 | - | 2 |
| | **එකතුව** | **117** | **73** | **46** | **2** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 46 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ii) අතිරික්ත සේවකයින් දෙදෙනා සඳහා විධිමත් අනුමැතියක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණු අතර එම අතිරික්ත සේවකයින් වෙනුවෙන් 2014 වර්ෂයේ අවසන් මාස 2 සඳහා රු.111,843 ක වැටුප් ගෙවා තිබුණි.

## 6. ශීර්ෂ 203 - ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

### 6.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| රාජකාරී දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) |
| විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |

## 6.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 05 කට 2015 ජුනි 30 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගනුදෙනුවල වටිනාකම රු 13,320,360 ක් විය.

## 6.3 විසර්ජන ගිණුම

### අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 04 ක් සඳහා සළසා තිබුණු රු.286,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 13 කට අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 ක සිට සියයට 77 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඇ) විසර්ජන ගිණුමේ සඳහන් ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවන්ට අනුව සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණවල වටිනාකම රු.15,937 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 94(1) සඳහන් විධිවිධානවලට අනුකූල නොවී වැය විෂයයන් 04 ක් සඳහා සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු ඉතිරිය රු.1,787,371 කින් ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි.

## 6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 20301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු වර්ෂ 12 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂවල එකතුව රු.46,178 ක් වූ අතර, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ 2006 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.3,000 ක හඳුනා ගෙන නොතිබුණු ශේෂය නිරවුල් කිරිමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

## 6.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 6.5.1 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශය, සංවර්ධන අංශය හා පාලන අංශයට අදාලව විෂයයන් 52 ක් යටතේ අභ්‍යන්තර විගණනය සැලැසුම් කර තිබුණත්, විෂයයන් 03 ක් පිළිබඳව පමණක් අභ්‍යන්තර විගණනය සිදු කර තිබීමෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

### 6.5.2 විගණන හා කළමනාකරණ කමිටුව

දෙපාර්තමේන්තුව විසින් විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පවත්වා නොතිබුණි.

## 6.6 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| (i) | XXIV වෙනි පරිච්ඡේදයේ 4.2.3 වගන්තිය හා 23 වන පරිශිෂ්ටය | | ණය අත්තිකාරම් ලබා දීමේදී විශ්‍රාම වැටුප් පරිවර්තනය කිරීම සඳහා දෙනු ලබන අවලංගු කළ නොහැකි පොරොන්දු ප්‍රකාශය ලබාගෙන නොතිබුණි. |
| (ii) | XXIV වැනි පරිච්ඡේදයේ 10.1 වගන්තිය | | ණය ඉල්ලීමේ සත්‍යතාවය සහ නිලධාරීන්ගේ පාලන විෂයය ඉක්මවා ගිය කරුණු නිසා මුදල් අපහසුකම් ඇති වූ බව ඔප්පු කිරීම සඳහා ඉල්ලුම්කරු විසින් සිය අවංක භාවයෙන්ම කරනු ලබන ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු වුවත් එම ප්‍රකාශ ලබා ගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| ( ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) | මුදල් රෙගුලාසි 751 (1), 454 හා 763 | 15,940,600 | නිල ඇඳුම් හා නිල ඇඳුම් රෙදි ලැබීම් බඩු ලේඛන පොතක සටහන් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 752 | | බඩු ලේඛන පොතෙහි සෑම සටහනක්ම බඩු ලේඛන වවුචරයකින් තහවුරු විය යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 753 (1) හා (2) . | | භාණ්ඩ නිකුත්කිරීමේ ඇණවුම් පොත් හා භාණ්ඩ ලැබීමේ ඇණවුම් පොත් භාවිතා කර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 264 | 880,000 | අවස්ථා 11 කදී ගෙවීම් කරන ලද දළ මුදලේ එකතුව රු.880,000 ක් වූ වියදම් සම්බන්ධයෙන් කුවිතාන්සි ලබා ගෙන නොතිබුණි. |
| (ඇ) | **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | | |
| | 2 හා 8.12.3 මාර්ගෝපදේශය | 15,940,600 | 2014 වර්ෂය සඳහා දහම් පාසල් ගුරුවරියන් සඳහා සාරි මිලදී ගැනිමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුමනය කර නොතිබුණු අතර ලැබුණු භාණ්ඩ පිළිබඳව ස්ථානභාර නිලධාරීයාගේ සහතිකයක් නොතිබුණි. |

## 6.7 කාර්යසාධනය

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුනොකර තිබුණු අතර, එසේ

නිරීක්ෂණය වූ අවස්ථාවන් පහත දැක්වේ.

(i) කිතුණු ආගමික සාහිත්‍ය කලා හා සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීම යටතේ ජාතික කිතුණු සාහිත්‍ය උලෙළ සඳහා ඇස්තමේන්තුගත රු.1,759,000 ක ප්‍රතිපාදනයෙන් සියයට 77 ක් ඉතිරි කර තිබුණි.

(ii) ජාතික කිතුණු සාහිත්‍ය උළෙල සඳහා කෙටි නාට්‍ය වැඩමුළුවක් පැවැත්වීමට අයදුම්පත් කැඳවීමේදී අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පෙර ඉදිරිපත් කළ අයදුම්පත නොසළකා එදිනට පසුව ඉදිරිපත් කළ අයදුම් පත්‍රයකට රු.135,000 ක් ගෙවා තිබුණි.

## 6.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

දහම් පාසල් ගුරුවරියන් සඳහා සාරි 11,985 ක් මිලදී ගෙන තිබූ අතර සාරි 7,829 ක් බෙදාහැර තිබීමෙන් හා අතැතිව සාරි 120 ක් පමණක් තිබීමෙන් රු. 4,439,600 ක් වටිනා සාරි 4,036ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

## 6.9 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලබේ.

(අ) අවශ්‍යතාවය ඉක්මවා දහම්පාසල් ගුරුවරියන් වෙනුවෙන් රු.138,600 ක් වැය කර සාරි 126 ක් වැඩිපුර මිලට ගෙන තිබුණි.

(ආ) ගිවිසුම්ගත නොවූවද, නිල ඇඳුම් ඇසුරුම් කිරීම සඳහා රු.48,230 ක ඇසුරුම් ගාස්තු ගෙවා තිබුණි.

## 6.10 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 02 | 01 |
| (ii) | ද්විතියික මට්ටම | 01 | 0 | 01 |
| (iii) | තෘතියික මට්ටම | 56 | 33 | 23 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 07 | 04 | 03 |
| | එකතුව | 67 | 39 | 28 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 28 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී තනතුර 2012 වර්ෂයේ සිට පුරප්පාඩු වී පැවතුණු අතර 2015 ජනවාරි සිට අගෝස්තු මාසය වන විටත් එම තනතුරේ වැඩ බැලීමට නිලධාරියෙකු පත් කර නොතිබුණි.

## 7. ශීර්ෂ 204 - හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

### 7.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** |
| --- | --- |
| ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය |
| කමිටු රැස්වීම් වාර්තා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3 මාර්ගෝපදේශය |

### 7.2 විසර්ජන ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවෙහි වර්ෂය තුළ එකතු කිරීම් ඩී.ජී.එස්.ඒ. 04 ආකෘතියෙහි අගයයන්ට සමාන විය යුතු වුවත්, එහි ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරන අගය රු.499,702 ක් වැඩියෙන්ද, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ රු.499,702 ක් අඩුවෙන්ද සටහන් කර තිබුණි.

(ආ) 2015 වර්ෂයේදී ගෙවීම් කළ 2014 වර්ෂයට අදාල රු.70,415 ක බැරකම් DGSA 8(I) බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා නොතිබුණි.

## 7.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

-----------------------------------------------------------------------

විෂය අංක 20401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිටි වර්ෂ 1 ක සිට වර්ෂ 22 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එන රු.186,930 ක් වූ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 7.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

------------------------------------

### 7.4.1 අභ්‍යන්තර විගණනය

---------------------

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර ඒ සඳහා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීනියක සේවයේ යොදවා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

### 7.4.2 විගණන හා කළමනාකරන කමිටුව

------------------------------------

දෙපාර්තමේන්තුව විසින් විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පවත්වා නොතිබුණි.

## 7.5 කාර්යසාධනය

--------------

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්මට අනුව දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**දහම් පාසල් ළමුන් සඳහා නිල ඇඳුම් මිලදී ගැනීම**

-----------------------------------------------

දහම් පාසල් 370 කට නිල ඇඳුම් සැපයීමට, 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා සංශෝධිත අයවැය ඇස්තමේන්තුව අනුව රු.10,000,000 ක් ප්‍රතිපාදන සළසා තිබුණු අතර, එය ප්‍රමාණවත් නොවීම නිසා මුදල් රෙගුලාසි 66 යටතේ රු.1,500,000 ක් ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ගෙන් මාරු කරගෙන තිබුණි. ඒ අනුව රු.11,500,000 ක් ප්‍රතිපාදන සළසා ගෙන තිබුණි. දෙපාර්තමේන්තුවේ වාර්ෂික ප්‍රගති වාර්තාව අනුව දහම් පාසල් 311 කට නිල ඇඳුම් රෙදි මිලදී ගැනීමට රු.11,487,000 ක් වැය කර තිබුණු බැවින් ඉලක්ක කළ දහම් පාසල් 59 කට නිල ඇඳුම් සැපැයීමට නොහැකි වී තිබුණි.

**7.6 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**-------------------------------------**

**ගැලපුම් කළ යුතු ශේෂ**

**------------------------**

2014 දෙසැම්බර් මාසය සඳහා දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ක කාලයක් ඉක්මවා තිබුණු එකතුව රු.141,843 ක් වූ චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**7.7 අවිධිමත් ගනුදෙනු**

**-------------------**

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථාවක් පහත දැක්වේ.

**කතරගම සංචාරක බංගලාව ඉදිකිරීමේ කටයුතු**

**------------------------------------------------**

කතරගම ඉදිකළ සංචාරක බංගලාවේ කෑම කාමරය, නිදන කාමරයක් ලෙස පරිවර්තනය කිරීම හා නාන කාමරයක් ඉදිකිරීමට එම ගොඩනැගිල්ල ඉදිකළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලබාගත් රු.666,798 ක ඇස්තමේන්තුව මත ඔවුන් වෙතම එම කාර්ය පවරා තිබීම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ඉහත සඳහන් ඉදිකිරීමට මූලික ප්‍රමාණපත්‍ර හා පිරිවැය ඇස්තමේන්තු දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර නොතිබුණු අතර, ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියකින් තොරව හා කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීමෙන් තොරව ඉහත කොන්ත්‍රාත්තුව භාරදී තිබුණි.

(ආ) තවද කොන්ත්‍රාත්තුවට අදාල ගොනුවක් කාර්යාලයේ නොතිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරු මෙම කාර්යය ඉටුකර නොතිබියදී කොන්ත්‍රාත්කරුට ගෙවීම් කිරීමට හැකිවනු පිණිස එකතු වටිනාකම රු.624,967 ක් වූ චෙක්පත් 4 ක් කොන්ත්‍රාත් සමාගම නමින් වර්ෂය අවසානයේදී ලියා තිබුණි. චෙක්පත් ලියා අවසන් කිරීමේදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 136,137,138 හා 139 හි දක්වා ඇති විධිවිධාන පරිදි, අදාල සේවය නිසි පරිදි ඉටුකර ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු නමුත් ඉටු නොකළ සේවාවන් සඳහා ගෙවීම් කිරීමට චෙක්පත් ලියා තිබීම විගණනයේදී පෙන්වා දීමෙන් අනතුරුව එම මුදල පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 7.8 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සදහන් දුර්වලතා නිරීක්ෂණ විය.

### (අ) පුස්තකාල පරිපාලනය

2007 වර්ෂයේ සිදුකරන ලද පුස්තකාල පොත් පිළිබඳ සමීක්ෂණයේදී පුස්තකාලය සතු පොත් 350 ක් පුස්තකාලය සතුව නොපවතින බව අනාවරණය වී තිබුණද, මුදල් රෙගුලාසි 103 හා 104 පරිදි නැතිවූ පොත් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.

### (ආ) වාහන පරීක්ෂාව

2013 අගෝස්තු මාසයේදී රු.49,260 ක් වැය කර අළුත්වැඩියා කළ කැබ් රථයක් 2013 සැප්තැම්බර් මාසයේදී ධාවනයෙන් ඉවත් කර තිබුණද, 2015 ජුනි 30 දින වන විටත් එය අපහරණය කිරීමට කටයුතු නොකිරීම නිසා දෙපාර්තමේන්තු භූමියේ දිරාපත් වෙමින් පැවතුණි.

## 7.9 මානව සම්පත් කළමනාකරණය

### 7.9.1 අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 06 | 05 | 01 |
| (ii) | ද්විතියික මට්ටම | 01 | - | 01 |
| (iii) | තෘතියික මට්ටම | 157 | 114 | 43 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 24 | 17 | 07 |
| | **එකතුව** | **188** | **136** | **52** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 52 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ii) 2013 සැප්තැම්බර් 12 දින සිට පරිපාලන නිලධාරී තනතුරේ පවතින පුරප්පාඩුව පිරවීමට කොන්ත්‍රාත් පදනමින් මාසිකව රු.23,506 ක දීමනාවක් ගෙවීමේ පදනම මත නිලධාරියෙකු 2013 සැප්තැම්බර් 12 දින බඳවා ගෙන තිබුණි.

## 8. ශීර්ෂ 205 - මහා භාරකාර දෙපාර්තමේන්තුව

### 8.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) |

### 8.2 විගණන සාක්ෂි නොවීම

කුවිතාන්සි, ස්ථාවර තැන්පතු සහතික ආදී වූ අවශ්‍ය සාක්ෂි දෙපාර්තමේන්තුවේ නොතිබීම නිසා එකතුව රු.16,669,375 කට අදාලවූ ගනුදෙනු 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

### 8.3 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

වැය විෂයයන් 3කට අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 71 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 8.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 20501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.657,194 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂයකට අඩු කාලයකට අදාල විය. එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 8.5 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

---

### 8.5.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

---

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබු අතර එය මුදල් වර්ෂය අවසාන වී 2015 මැයි 26 දින පිළියෙල කර තිබුණි.

### 8.5.2 අභ්‍යන්තර විගණනය

---

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණද භාර හා බූදල් සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

### 8.5.3 වත්කම් කළමනාකරණය

---

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී දෙපාර්තමේන්තුවට අයත් ජීප් රථයක් භාවිතයට ගැනීමෙන් තොරව වසර 03 ක පමණ කාලයක් නිෂ්ක්‍රීයව දෙපාර්තමේන්තු භූමියේ පැවතුන බව අනාවරණය විය.

## 8.6 අනුකූල නොවීම්

---

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

---

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 264 | 159,625 | අළුත්වැඩියා කිරිම් වෙනුවෙන් වූ අවස්ථා 14 කදී සිදු කර තිබුණු අළුත්වැඩියා සඳහා එකතුව රු.159,625 ක ගෙවීම් කර තිබුණත්, එම ගෙවීම් ලද බවට පාර්ශවයන්ගෙන් කුවිතාන්සි ලබාගෙන නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 454 හා 751 | 50,100 | අවස්ථා 05 කදී මිලදී ගත් එකතුව රු.50,100 ක් වූ භාණ්ඩ, මුදල් රෙගුලාසි ප්‍රකාරව බඩු ලේඛන පොතක සටහන් කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 752 | | බඩු ලේඛන පොතෙහි සෑම සටහනක්ම වවුචරයකින් තහවුරු විය යුතු වූවත්, වවුචර අංකය බඩු ලේඛන පොතෙහි සටහන් කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 1641 | | දෙපාර්තමේන්තුවට අයත් භාර බූදල් සතු වාහන 02 ක් එහි හිමිකරුවන් වෙත භාරදෙන තුරු සුරක්ෂිතව තබා ගැනීමෙන් තොරව අනාරක්ෂිතව නවතා තිබුණි. |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 14/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 02 ඡේදය | - | දෙපාර්තමේන්තුවට අයත් වාහන 11 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහනයවීම පිළිබඳ පරීක්ෂණයක් 2014 දෙසැම්බර් 31 දිනටත් සිදුකර නොතිබුණි. |
| 03.14 ඡේදය | | කොළඹ තිබෙන වාහන සම්බන්ධයෙන් කොළඹ, දෙහිවල - ගල්කිස්ස මහනගර සභා සීමාවේ සහ කෝට්ටේ නගර සභා සීමාවේ පිහිටි ගරාජවලින් මිලගණන් කැඳවා වාහන අළුත්වැඩියා කිරීමට ප්‍රවීනත්වයක් දරන ගරාජ තෝරාගෙන ඒවායේ නාම ලේඛනයක් සකස් කර අළුත්වැඩියාවන් සඳහා ටෙන්ඩර් කැඳවීම |

කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව සතු වාහන අළුත්වැඩියා කිරීමේදී කඩවත හා වේයන්ගොඩ පිහිටි ගරාජවලින් මිලගණන් කැඳවා අළුත්වැඩියා කටයුතු සිදු කර තිබුණි.

**8.7 කාර්යසාධනය**

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**8.7.1 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

දෙපාර්තමේන්තුව සිය අරමුණුවලට අදාළ කාර්යවලින් බැහැරව ක්‍රියා කළ අවස්ථා නිරීක්ෂණය වූ අතර, නියැදි විගණන පරීක්ෂණවලදී එසේ අනාවරණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) ආගමික හා සමාජ සේවා පොදු අරමුදල් භාරය මගින් වියදම් දැරීම**

දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 10 ක මූලික ආයෝජනයක් කරමින් ආගමික හා සමාජ සේවා පොදු අරමුදල් භාරය නමින් භාරයක් දෙපාර්තමේන්තුව පිහිටුවා තිබුණි. 2014 වර්ෂය ආරම්භ වන විට මෙම භාරයට අදාල ගිණුමේ තිබුණු රු.81,606,870 ක හර ශේෂය පිළිබඳ සැලකීමෙන් තොරව, වෙනත් භාර හා බූදල් සතු මුදල් ද, හිමිකම් නොපෑ විදේශ වන්දි මුදල් ද, විහාර වන්දි ලෙස ලැබෙන මුදල් ද යොදවා ගෙන 2014 වර්ෂයේදී රු.33,857,136 ක් මෙම භාරය නමින් ගෙවා තිබීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) සාමාන්‍ය පරිපාලන කටයුතු සඳහා ප්‍රතිපාදන සළසා තිබුණු වැය විෂයයන් වල අධිවැය වාර්තා නොවන පරිදි ප්‍රතිපාදන ඉක්මවා සිදු කරනු ලබන ආගමික සමාජ සේවා පොදු භාර අරමුදලින් කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට වැය විෂයයන් 6 ක් වෙනුවෙන් වූ රු.1,571,848 ක අධිවැය මෙම අරමුදලින් පියවා තිබුණි.

(ii) 2014 වර්ෂය ආරම්භයේ භාරයේ තිබුණු රු.81,606,870 ක හර ශේෂය පිළිබඳ සැලකීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 7 කට අදාල රු.31,969,288 ක් අරමුදලෙන් වැය කර තිබුණි.

(iii) මහා භාරකාර දෙපාර්තමේන්තුවට අයත් භාර බූදල් සතු විදේශවල පවතින වත්කම් සම්බන්ධයෙන් ඔප්පු අත්සන් කිරීමට ගුවන් ටිකට්පත් ලබාගැනිමේ වියදම් අදාල භාර බූදල් ගිණුම්වලින් ලබා ගත යුතු වුවත්, ආගමික සමාජ සේවා පොදු භාරයෙන් අවස්ථා දෙකකදී ගුවන් ටිකට් සඳහා රු.316,000 ක් වැය කර තිබුණි.

**(ආ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

**----------------------------------------------**

විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව දෙපාර්තමේන්තුව මගින් පාලනය වන භාර 1019 ක් හා බූදල් 130 කට අදාල අරමුණු ප්‍රමාණවත් පරිදි ඉටු කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) වීරසිංහ අබේනායක බූදලය**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අන්තිම කැමති පත්‍රයේ අරමුණු ඉටුකිරීමට 1982 මාර්තු 30 දින අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ලබාදී තිබුණත්, මේ සම්බන්ධයෙන් භාර ඔප්පුවක් සකස් කිරීමට වර්ෂ 28ක කාලයක් ගත වී තිබුණි.

(ii) බූදල්කරුවන්ගේ අන්තිම කැමති පත්‍රය අනුව බූදලයට ලැබෙන ආදායම් උපයෝගී කරගෙන අරමුදලක් අරම්භ කර භාර අරමුණු ඉටුකළ යුතු විය. බූදලයේ නිශ්චල දේපල විකිණීමෙන් ලැබෙන මුදල් මහා භාරකාරවරයා විසින් මෙම භාරය නමින් තැන්පත් කළ යුතුය යනුවෙන් අර්ථකථනය කර මාතර ගබඩා වීදියේ පුංචි පතහෙ වත්තේ B අක්ෂරය දරන ඉඩම් කැබැල්ලෙන් බෙදූ අංක 6 දරන පර්චස් 35 ක ඉඩම විකුණා ලද රු.2,500,000 ක මුදල් වීරසිංහ අබේනායක අරමුදල නමින් බැංකුවේ තැන්පත් කර එම අරමුදල ආරම්භ කර තිබුණි.

(iii) මාතර ගබඩා වීදියේ පුංචි පතහෙ වත්තේ B අක්ෂරය දරන කැබැල්ලෙන් බෙදූ අංක 3 දරන පර්චස් 32 ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිල්ල මීට පෙර බදු ගැණුම්කාරියට රු.360 ක මාසික කුලියට බදු දීම සම්බන්ධයෙන් කිසිඳු සාක්ෂියක් නොතිබුණු අතර, මහා භාරකාරවරයා විසින් තම වගකීම් නිසි ලෙස ඉටු නොකිරීම මත ඇය විසින් මෙම දේපල රු.8,000 මාසික කුලියට අතුරු බදු දී ආදායම් උපදවා ගෙන තිබුණි.

(iv) බදු ගැණුම්කාරිය මෙම දේපල වෙනුවෙන් 2012 ජුනි 15 දින අංක 32 දරන නීත්‍යානුකූල නොවන ප්‍රකාශන ඔප්පුවක්ද, 2012 ජුනි 27 දින අංක 34 දරන නීත්‍යානුකූල නොවන තෑගි ඔප්පුවක්ද සකස් කර මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නීතිමය පියවර ගෙන නොතිබුණි.

(v) මහා භාරකාර දෙපාර්තමේන්තුව විසින් මෙම දේපල 2013 පෙබරවාරි 05 දින අංක 312 දරන බදු ගිවිසුමෙන් මාසිකව රු. 8,000 බැගින් නැවත බදු දී තිබුණත්, මාසික බදු කුලිය පිළිබඳව තක්සේරු

දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වාර්තාවක් ලබාගෙන නොතිබුණි.

(vi) උක්ත බදු ගිවිසුම 2013 දෙසැම්බර් 31 දින අවසන් වී තිබුණද, විගණන දිනය වූ 2015 මාර්තු 10 දින වන විටත් ගිවිසුම අළුත් කිරීමට හෝ නව ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි. 2014 මාර්තු මාසයේ සිට විගණන දිනය වූ 2015 මාර්තු 10 දින දක්වා බදුකරු විසින් නොගෙවා හිඟහිටව තිබුණු රු.88,000 ක බදුකුලිය අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(vii) උක්ත බූදලයට අයත් මොදරමුණේයාය වත්තෙන් හෙක්ටයාර් 31.0287 ක් රජයට පවරා ගැනීම වෙනුවෙන් ලැබුණු රු.16,500,000 ක වන්දි මුදල ප්‍රමාණවත් නොවීම මත ගොනුකළ අභියාචනය ප්‍රතික්ෂේපවීමෙන් පසුව ලබාගත් ඉහත සඳහන් මුදල මෝදරමුණේයාය වත්තේ ගිණුමට බැර නොකර පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණි.

(viii) මෝදරමුණේයාය වත්තෙන් රජයට පවරා නොගත් හෙක්ටයාර 0.1837 ක් හෙවත් පර්චස් 72 ක ඉඩම් කොටස පිළිබඳ කිසිදු සටහනක් විගණනයට ඉදිරිපත් නොවුණි.

(ix) ඉහත සඳහන් කරුණු අනුව බූදල් කරුවන්ගේ 1956 මැයි 09 දිනැති අංක 19047 දරන අන්තිම කැමති පත්‍රය හා තෙස්තමේන්තුව ප්‍රකාරව 1982 මාර්තු 3 දිනැති අද්මිනිස්ත්‍රාත් බලපත්‍රය ප්‍රකාරව ඔවුන්ගේ අභිප්‍රායන් ඉටු කිරීමට විගණන දිනය වූ 2015 මාර්තු 10 දින වන විටත් මහා භාරකාර දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**(ආ) බූදල් හා භාර වලින් වූ ඌණතාවයන්**

2013 වර්ෂයේදී බූදල් හා භාරවලින් එකතුව රු.296,023 ක ඌනතාවයන් නියැදි විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

| බූදලයේ / භාරයේ නම | 2013 වර්ෂයේ | | වියදමේ ස්වභාවය | ඌනතාවය |
|---|---|---|---|---|
| | ආදායම | වියදම | | |
| | රු. | රු. | | රු. |
| හීනටිය පල්ලියගේ සීලවතී ද සිල්වා බූදලය | 16,088 | 32,400 | අරමුණු ඉටුකිරීම හා වෙනත් වියදම් ලෙස | 16,312 |
| ටී ටී ද සිල්වා බූදලය | 567,999 | 656,352 | භාරයේ අරමුණු ඉටු කිරීම හා මහාභාරකාර ගාස්තු | 88,353 |
| අමරදේව පදනම් භාරය | 43,240 | 234,598 | අරමුණු ඉටු කිරීම හා මහාභාරකාර ගාස්තු | 191,358 |
| **එකතුව** | | | | **296,023** |

**(ඇ) අරමුණු ඉටුකිරීමට ක්‍රියාමාර්ග නොගැනීම**

නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් භාර අරමුදල් හා භාරයන්ගේ අරමුණු ඉටු කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

| බූදලයේ / භාරයේ නම | 2013 දෙසැම්බර් 31 දිනට | | අරමුණු |
|---|---|---|---|
| | ආයෝජන වටිනාකම | බැංකු ශේෂය | |
| | රු. | රු. | |
| ශ්‍රී ලංකා දැඩි උපස්ථාන ඒකක පදනම් භාරය | 1,310,000 | 148,768 | ශ්‍රී ලංකා ජාතික රෝහලේ දැඩි සත්කාර ඒකකයට අදාල ද්‍රව්‍ය ලබා දීම |
| උඩරට ක්‍රීඩා, කලා කර්මාන්ත හා සංස්කෘතික භාරය | 1,114,171 | 304,528 | කැන්ඩියන් සංස්කෘතික මධ්‍යස්ථානයේ සංස්කෘතික කටයුතු සඳහා ආධාර ලබාදීම. |
| සංස්කෘතික මධ්‍යස්ථාන භාරය | 12,241,584 | 219,563 | සියළුම සංස්කෘතික මධ්‍යස්ථාන වල දියුණුව හා සංවර්ධනය වෙනුවෙන් ආධාර ලබා දීම. |
| ලොකුගේ ටියුඩර් වීරසිංහ සහන උදය වැඩිහිටි විවේකාශ්‍රම භාර අරමුදල | 2,540,392 | 363,366 | භාරකාර මණ්ඩලයේ ඉල්ලීම අනුව ගෙවීම් කිරීම. |

**(ඇ) ඩී.බී. ජයතිලක බුදලය**

මහා භාරකාර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ඩී.බී. ජයතිලක බුදලයට අදාල ලෙජර් ගිණුමේ 2013 වර්ෂය අවසානයේදී රු.5,819,882 ක හර ශේෂයක් පැවැතුණි. මෙම බුදලයේ වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවති හර ශේෂ පිළිබඳව විමසිලිමත් නොවී 2013 වර්ෂයේදී රු.3,219,165 ක් වියදම් කිරීම පිළිබඳව සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ඩී.බී. ජයතිලක භාර ඔප්පුවේ 14(ඊ) ජේදය අනුව අධ්‍යාපන ආධාර ප්‍රදානය කළ යුතු ආකාරය නිශ්චිතව දක්වා තිබුණත්, ඊට පටහැනිව අවස්ථා 02කදී රු.110,000 ක ආධාර ගෙවා තිබුණි.

(ii) භාර ඔප්පුවේ 10 වැනි ජේදය අනුව ආගමික ආධාර ගෙවිය හැකි වුවත්, බුදලයේ හර ශේෂයක් තිබියදී, පාලනයකින් හා විධිමත් ක්‍රමවේදයකින් තොරව ආගමික ආධාර හා ශිෂ්‍යාධාර ගෙවා තිබුණු බව නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | වර්ෂයේ ආරම්භක හර ශේෂය | ගෙවූ ආගමික ආධාරවල වටිනාකම | ශිෂ්‍යාධාර |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 2013 | 8,798,294 | 1,206,550 | 109,900 |
| 2014 | 5,819,882 | 493,000 | 290,000 |

(iii) භාරයට අදාල දේපළ පිළිබඳ විස්තරාත්මක උපලේඛනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඉ) භාර බුදල් සම්බන්ධ ගිණුම් ඉදිරිපත් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 වර්ෂය සඳහා වන භාර බුදල් අවසාන ගිණුම් 2015 ජුනි 30 දින වන විට ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2012 හා 2013 වර්ෂ සඳහා පිළියෙල කර තිබූ භාර අවසාන ගිණුම්වල ඉරහඳයාව වත්තට අදාල ගිණුම හා ආගමික හා සමාජ සේවා පොදු භාරයට අදාල ගිණුම මඟ හැරී තිබුණි. ඒ අනුව එම වර්ෂවල අවසන් ගිණුම් මඟින් සියළුම භාරයන් පිළිබඳ නිවැරදි වූත් සත්‍ය වූත් තත්ත්වයන් පෙන්නුම් කර නොතිබුණි.

(iii) එක් භාරයක් සතුව විවිධ දේපල පවතින විට එම භාරය සඳහා තනි ගිණුමක් පවත්වා ගැනීම වෙනුවට කුඩා ගිණුම් කිහිපයක් පවත්වා තිබුණු අතර එම ගිණුම් සියල්ල එක් ගිණුමක් ලෙස සාරාංශ කර ඉදිරිපත් කර නොතිබුණි.

## 8.10 අවිධිමත් ගනුදෙනු

----------------------

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

------------------------------------------------------------------------

පරිගණක මුද්‍රණ යන්ත්‍ර අළුත්වැඩියා හෝ සේවා සපයා ගැනීමේදී හා කාර්යාලීය ලිපි ද්‍රව්‍ය, උපකරණ මිලදී ගැනීමේදී මහා භාරකාර දෙපාර්තමේන්තුව සේවා සපයන ආයතනවල ලියාපදිංචි නම් ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණු අතර සේවා සැපයීම් සම්බන්ධයෙන් සේවා ගිවිසුම්වලටද එළඹ නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. ඒ අනුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3:4.3 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර 3:4.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු කැඳවීම් සිදු නොකිරීම හේතුවෙන් තරඟකාරී මිල ගණන් යටතේ ලැබිය යුතු ආර්ථික වාසි දෙපාර්තමේන්තුවට අහිමි වී තිබුණි.

**(ආ) අම්බුළුවාව පාරිසරික සංවර්ධන හා සංරක්ෂණ භාරය**

------------------------------------------------------------

විගණන දිනය වූ 2014 ජූලි 31 දිනට ශේෂපත්‍රය අනුව භාරයේ බැංකු අයිරාව රු.22,771,316 ක් වී තිබුණි. මෙම භාරයෙන් 2013 වර්ෂයේ සිට 2014 ජූලි 31 දින දක්වා කාලය තුළ රු.18,966,869 ක ගෙවීම් කර තිබුණත්, එම ගෙවීම් භාර අරමුණුවලට පටහැනිව සිදු කර තිබුණු බව නිරීක්ෂණය විය.

## 8.11 පාඩු හා හානි

----------------

2007 ජනවාරි 27 දින දෙපාර්තමේන්තුවේ වාහනයක් අනතුරට පත් වීමෙන් රු.254,038 ක අලාභහානියක් සිදු වී තිබුණි. එම අලාභහානිය සිදු වී වර්ෂ 8 ක පමණ කාලයක් ගත වි තිබුණත්, අදාල වගකිව යුතු පාර්ශවයන්ගෙන් එම අලාභය අයකර ගැනිමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 8.12 විසඳා නොතිබුණු විගණන ඡේද

------------------------------------

දෙපාර්තමේන්තුවට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු පසුවිපරම් කටයුතු නිම නොවූ ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| **2012** | **5.1** | **ප්‍රමුඛ බැංකුවේ මුදල් ආයෝජනය**<br>2008 අප්‍රේල් 23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ නිවේදනයට අනුව බැංකුවක ආයෝජනය කර තිබුණු මහා භාරකාර දෙපාර්තමේන්තුව යටතේ පවතින භාර හා බූදල් 40 කට අයත් රු.129,052,032 ක් එම බැංකුව වසා දැමීමෙන් පසු රජයට අයවිය යුතු තැන්පත් බැරකම් ලෙස සළකා, රජයේ ඉතිරි කිරීමේ බැංකුවක රජයට අයත් කොටස් ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කර තිබුණි. 2001 හා 2002 වර්ෂවලදී වසා දැමූ බැංකුවේ ආයෝජනය කර තිබුණු එම රු.129,052,032 ක මුදල සඳහා පවතින සාමාන්‍ය පොළී අනුපාතයන් මත අයවිය යුතුව තිබුණු රු.මිලියන 160 ක පමණ වූ පොළී ආදායම 2014 වර්ෂය අවසානය වන විටත් ලබාගැනීමට නොහැකි වී තිබුණි. |
| **2012** | **9** | **පොදු ආයෝජන පොළී ගිණුම**<br>(i) භාරයෙහි අරමුණ හා මුදල් වැය කරන ආකාරය පිළිබඳ ඔප්පුවෙහි 6(අ) ඡේදයේ දක්වා ඇති පරිදි එහි මුදල් මහා භාරකාරවරයාගේ අභිමතය පරිදි කිසිදු ක්‍රමවේදයකින් තොරව වැය කිරීමට අවකාශය උසාවි තීන්දු මඟින් ලබා ගෙන තිබුණි. මෙම තත්ත්වය උපයෝගී කරගෙන 2012 වර්ෂය තුළ උපයාගත් ආකාරය හෙළිදරව් කිරීමට සාක්ෂි නොමැතිව කරන ලද වියදම හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට මෙම ගිණුමෙහි ඌනතාවය රු.40,876,742 ක් විය. එමෙන්ම එහි ආයෝජන වටිනාකම රු.15,000,000 ලෙස දක්වා තිබුණ ද භාර ඔප්පුව අනුව භාරය සතුව තිබිය හැකි ආයෝජනවල වටිනාකම රු.10,000,000 ක් විය.<br>(ii) මෙම භාරය මගින් වැටුප් ගෙවමින් කාර්ය මණ්ඩලය බඳවා ගැනීමටද උසාවි අවසර ලබාගෙන ඇති අතර මෙම |

තත්ත්වය 1988 සංශෝධිත මහා භාරකාර ආඥා පනතෙහි 3,4(12) හා 44 වගන්තිවලින් මහාභාරකාරවරයා වෙත පැවරී ඇති බලතල ඉක්මවා කටයුතු කිරීමක් බව නිරීක්ෂණය විය. මේ අනුව 2012 වර්ෂය වන විට මහා භාරකාරවරයා විසින් නිලධාරීන් 28 ක් බඳවාගෙන තිබුණු අතර ඔවුන් බඳවා ගැනීම හා සේවයේ යෙදවීම ඉතාමත් අවිධිමත් පරිදි සිදුකර තිබුණි.

**2012 10.1 අම්බුළුවාව පාරිසරික සංවර්ධන හා සංරක්ෂණ භාරය අවිධිමත් පරිදි පරිපාලනය කිරීම**

---

(i) අම්බුළුවාව ප්‍රදේශයේ පාරිසරික හා ජෛව විවිධත්වය සංවර්ධනය කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ අරමුණ ඇතිව 2000 සැප්තැම්බර් 01 දින රු.100,000 ක මූලධනයකින් ආරම්භ කළ මෙම භාරයට අදාළ ගිණුමේ විගණිත දිනය වූ 2013 සැප්තැම්බර් 11 දිනට රු.22,709,170 ක අයිරා ශේෂයක් විය.

(ii) භාර අරමුණුවලට පටහැනිව පෞද්ගලික වෛද්‍ය බිල්පත් පියවීම වෙනුවෙන් අවස්ථා 02 කදී එකතුව රු.2,802,816 ක් ද, ගුවන් ටිකට්පත් මිලදී ගැනීම වෙනුවෙන් රු.1,296,352 ක් සහ වාහන අළුත් වැඩියාව හා රක්ෂණ වෙනුවෙන් රු.314,731 ක් වශයෙන් රු.4,413,899 ක් අවිධිමත් පරිදි භාරයෙන් ගෙවා තිබුණි.

(iii) තවද කළමනාකරණ මණ්ඩල අනුමැතියකින් තොරව සහ භාරයෙහි අරමුණුවලට පටහැනිව අවිධිමත් පරිදි අවස්ථා 04 ක දී එකතුව රු.2,300,000 ක් ගෙවා තිබුණි.

(iv) 2010 දෙසැම්බර් මාසයේ දී රු.3,431,400 කට මිලදී ගෙන තිබුණු ජීප් රථයක් 2012 ජනවාරි මාසයේ දී භාරයෙහි කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියකින් තොරව සහ නීති,රීති හා රෙගුලාසිවලට පටහැනිව රු.3,400,000 කට විකුණා තිබුණි.

(v) 2012 ජනවාරි මාසයේ දී රථයක් මිලදී ගැනීමට රු.4,000,000 ක් ගෙවා තිබුණ ද එම වාහනය මිලදී ගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(vi) බැංකුවක ආයෝජනය කළ රු.15,000,000 කට අදාල පොළී අයකර නොගැනීම, අවස්ථා 14 ක දී එකතුව රු.10,754,399 ක් ස්ථාපකගේ අනුමැතියකින් තොරව මුදා හැර තිබීම, ගිණුම් වාර්තා සකස් කර විගණනයට ඉදිරිපත් නොකිරීම යන කරුණු හේතුවෙන් භාර ඔප්පුවේ 08, 16, 18 කොන්දේසි කඩ වී තිබුණි.

**2012** **10.3** **බූදලයක් පවරා ගැනීම**

----------------------------

බූදලයක් පවරා ගැනීම සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණන් කරනු ලැබේ.

(i) 2010 අප්‍රේල් 19 දින අදාල භාරය දෙපාර්තමේන්තු භාරයට පත්වීමෙන් පසු භාරයට අයත් වත්කම් පවරා ගැනීමේ මූලික කටයුතු සඳහා පළපුරුදු හා සුදුසුකම්ලත් නිත්‍ය කාර්ය මණ්ඩලයක් සිටියදී එම කාර්යයන් විධිමත් ක්‍රමවේදයකින් තොරව බාහිර පුද්ගලයකු මගින් ඉටුකරවා ගෙන බූදලය සතු මුදලින් එකතුව රු.1,003,955 ක් 2010,2011,හා 2012 වර්ෂයන්හිදී වියදම් කර තිබුණි. එම ගෙවීම් සනාථ කිරීමේ ලියවිලි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) රාජ්‍ය බැංකුවක සේප්පුවක තැන්පත් කර තිබුණු එම බූදලයට අයිති රන් භාණ්ඩ හා වටිනා වත්කම් අයිතමයන් 80 ක් පිළිබඳ අදාල දෙපාර්තමේන්තු ලිපි ගොනුවල සහ උසාවියට ඉදිරිපත් කළ වත්කම් ලේඛනයේ සඳහන් කර නොතිබුණි.

(iii) උසාවියට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, බූදල්කරු සතුව පැවති බැංකු ශේෂවල වටිනාකම රු.45,324,443 ක් වුව ද, විගණනයට ලැබුණු තොරතුරු අනුව එම ශේෂය රු.51,906,005 ක් විය. එසේම බූදල්කරු සතුව පැවති තවත් බැංකු ශේෂයක වටිනාකම රු.304,445 ක් අඩුවෙන් තොරතුරු සඳහන් කර උසාවියට ඉදිරිපත් කර තිබුණි.

(iv) ඉහත බැංකු ශේෂයන්ට අමතරව උසාවියට ඉදිරිපත් කළ අනෙකුත් බැංකුවල පැවති එකතුව රු.53,646,470 ක් වූ ශේෂයන් පිළිබඳ විස්තර ඇතුළත් බැංකු වාර්තා බූදල් ලිපිගොනු වලට ඇතුලත් කර නොතිබුණු බැවින් එම ශේෂයන්වල නිවැරදිතාවය පිළිබඳ තහවුරුවක් ද විගණනයට ලබාගත නොහැකි විය.

(v) විගණන දිනය වූ 2012 දෙසැම්බර් 20 දින වන විට අදාල බූදල් හිමිකරු මියගොස් වර්ෂ 02 යි මාස 08 ක් ගතවී තිබුණ ද ඔහුගේ අන්තිම කැමති පත්‍රයේ සඳහන් වූ පරිදි ඔහු සතුව තිබුණු බණ්ඩාරවෙල පිහිටි නිවස තුළ සිල්මාතා ආරාමයක් ආරම්භ කිරීමත්, එහි භාවනා පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමත් යන කටයුතු කොළඹ මහාබෝධි සමාගම සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කර නොතිබුණි. එසේම ශ්‍රී ලංකා මහාබෝධි සංගමයේ නියෝජිතයෙකු ඇතුළත් පුද්ගලයින් 06 දෙනෙකුගෙන් සැදුම්ලත් අධ්‍යක්ෂක මණ්ඩලයක් භාරය පරිපාලනය සඳහා පත් කර නොතිබුණි.

**2012** **13.2** **අවිධිමත් පත්වීම් සහ රාජකාරි පැවරීම්**

-----------------------------------------------

මහා භාරකාර දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු සඳහා අනුමත කාර්ය මණ්ඩලයට පරිබාහිරව විධිමත් අනුමැතියකින් හා බඳවා ගැනිමේ පටිපාටියකින් තොරව නිලධාරින් 28 දෙනෙකු 2012 වර්ෂයේදී බඳවාගෙන තිබුණි. එම බඳවාගැනීම් සඳහා පිළිගත හැකි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. එම නිලධාරීන් සඳහා අවිධිමත් පරිදි භාර හා බූදල්වල අරමුදල් උපයෝගී කරගෙන මුදල් රැස්කරමින් පවත්වාගෙන යනු ලබන ආගමික සමාජ සේවා පොදු භාර අරමුදල නම් අරමුදලින් වැටුප් ගෙවා තිබුණි. එසේ පත්කරන ලද නිලධාරීන් දෙදෙනෙකු පිළිබඳ පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සුදුසුකම් පරීක්ෂාවකින් තොරව සතියකට දින 3ක් පමණක් සේවයට පැමිණිය යුතුයි යන කොන්දේසිය මත ශ්‍රී ලංකාවේ මහා භාරකාර තැනගේ 2012 මැයි 01 දිනැති ලිපිය මඟින් කොන්ත්‍රාත් පදනමට නීතිඥයෙකු බඳවා ගෙන මසකට රු.35,000 ක් බැගින් දීමනාවක් ගෙවා තිබුණි. 2012 මාර්තු 02 දිනැති රාජකාරි පැවරීම් ලිපියට අනුව දෙපාර්තමේන්තුවේ නිත්‍ය තනතුරක් වන නියෝජ්‍ය මහා භාරකාර තැනගේ රාජකාරි සියල්ලම එම නිලධාරියාට පවරා තිබුණි.

(ii) බඳවා ගැනීමේ පටිපාටියකින් තොරව දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරී ලෙස නිලධාරියකු බඳවා ගෙන පසුව මෙම නිලධාරියාට විමර්ශන නිලධාරි තනතුරක් ලබාදී ඔහු දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශ භාර නිලධාරී ලෙස පත්කර තිබුණි. ඔහුට දෙපාර්තමේන්තුව භාරයේ පවතින බූදල් දෙකකට අදාළ රාජකාරී ඉටුකිරීම වෙනුවෙන් එම බූදල්වලින් මසකට රු.20,000 බැගින් ගෙවා තිබුණි.

**2013 4.4 විදේශ වන්දි ගෙවීම නිසි පරිදි කළමණාකරණය නොකිරීම**

------------------------------------------------------------------

විදේශ රටවල සේවයේ නියුතුව සිටියදී හදිසියේ මියයන හෝ ආබාධිත තත්වයට පත්වන ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් විදේශ රටවලින් ඔවුන්ගේ හිමිකරුවන්ට ලැබෙන විදේශ වන්දි මුදල් ගෙවීම නිසි සැලකිල්ලකින් හා කාර්යක්ෂමව සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) ඒ අනුව 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විදේශ වන්දි මුදල රු.41,623,427ක් වූ අතර එම වන්දි මුදල්, දෙපාර්තමේන්තු බැංකු ගිණුමේ මාස 06 ත් අවුරුදු 10 ත් අතර කාලයක් තුළ රඳවාගෙන තිබුණි.

(ආ) විදේශ වන්දි ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් වන්දි මුදල මත උපලබ්ධි වන පොලී ප්‍රතිලාභය වන්දිහිමියාට ලබා දීමට හැකි ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කර නොතිබුණි. මේ හේතුවෙන් වන්දි මුදල් මත උපලබ්ධි වන පොලිය දෙපාර්තමේන්තු පොදු මුදල් ගිණුමේ එක්රැස් වී අවිධිමත් ගෙවීම් සඳහා වැය වීමට හැකියාව ඇති වන බව නිරීක්ෂණය විය.

| | | |
|---|---|---|
| 2013 | 4.8 (ආ) | **අවිනිශ්චිත ගිණුම** |

--------------------

භාර බුදල් සම්බන්ධයෙන් ගිණුම් තැබීමේ නිසි ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන් භාර බුදල්වලට අදාලව දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පොලී මුදල් බැරකළ යුතු ආකාරය නිශ්චිතව හඳුනාගත නොහැකි වීම නිසා ඒ පිළිබඳ තොරතුරු ලැබෙන තෙක් අවිනිශ්චිත ගිණුමකට බැර කර තිබුණි. එම ගිණුමේ තොරතුරු නිශ්චිතව හඳුනාගෙන නිරවුල් නොකිරිම හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.8,353,407ක ශේෂයක් නිරීක්ෂණය විය.

| | | |
|---|---|---|
| 2013 | 4.8 (ඇ) | **කඩවත - මහර නගර සංවර්ධන භාරය.** |

--------------------------------------------

මහර මැතිවරණ ප්‍රදේශයේ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති වැඩි දියුණු කිරිම හා නඩත්තු කිරිම වෙනුවෙන් දායක වීම සහ ලසන්ත අලගියවන්න පදනමේ කටයුතු සඳහා හැකි අවස්ථාවල මූල්‍යමය දායකත්වය ලබාදීම අරමුණු කර ගනිමින් පිහිටුවන ලද “කඩවත මහර නගර සංවර්ධන ව්‍යාපෘති භාරය” පිළිබඳ පරීක්ෂාවේදී පහත සඳහන් ඌනතාවයන් නිරීක්ෂණය විය.

(i) භාර ඔප්පුවේ 08 වැනි ඡේදය අනුව මූලධනයට ලැබෙන පොලී ආදායමෙන් රජයේ ගාස්තු අය කිරීමෙන් අනතුරුව ඉතිරි මුදල් ස්ථාපකගේ අරමුණු සඳහා යෙදිය යුතු බවත් 09(ආ) ඡේදයට අනුව පාලන භාරකාර මණ්ඩල සාමාජිකයින්ගේ

එකඟත්වය මත ස්ථාපක විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමකට යටත්ව මෙකී පොලී මුදල් නිදහස් කළ යුතු බවත් දක්වා ඇත. එහෙත් ඊට පටහැනිව මූලධන වර්ධනය සඳහා පෞද්ගලික දුරකථන සමාගමකින් ලැබුණු රු.1,500,000 ක් ආයෝජනය කිරීමෙන් තොරව, මූලධන ගාස්තුද අයකර ගෙන නිදහස් කර තිබුණි.

(ii) භාර ඔප්පුවේ 09 (ආ) ඡේදය ප්‍රකාරව ඊළඟ පොලී මුදල නිදහස් කිරීමට පෙර මීට පෙර නිදහස් කරන ලද මුදලින් සිදුකරන ලද ව්‍යාපෘතිවලට අදාල විස්තර වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් ඊට පටහැනිව එකතුව රු.3,128,250 ක් අවස්ථා 2කදී නිදහස් කර තිබුණි.

**2013** **6.9 (අ)** **පූජා භාණ්ඩ මිලදී ගැනීම**

**------------------------------**

දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂය තුළ අටපිරිකර හා වෙනත් පූජා භාණ්ඩ මිලදී ගැනීමට රු.19,838,920 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් ඌනතා නිරීක්ෂණය විය.

(අ) විධිමත් පරිදි ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කිරීමෙන් තොරව අටපිරිකර හා පූජාභාණ්ඩ මිලදී ගැනීම සඳහා එකතුව රු.19,838,920 ක් ආයතන 5ක් වෙත 2013 වර්ෂයේදී ගෙවා තිබුණි.

(ආ) ඕකේවල ප්‍රදේශීය ලේකම් කාර්යාලයට සිවුරු 150 ක් මිලදී ගැනීමට රු.112,500 ක් ගෙවා තිබුණද මිලදී ගැනීම්වලට අදාල බිල්පත් වවුචරය සමඟ ගොනු කර නොතිබුණි. එසේම ගෙවීම්වල නිරවද්‍යතාවය හා විනිවිදභාවය පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්විය නොහැකිය. තවද, ඕකේවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් මුදල් ලද බවට ලදුපතක් ද නිකුත් කර නොතිබුණි.

(ඇ) ආගමික උත්සව සඳහා හෝ විහාරස්ථාන සඳහා පූජා භාණ්ඩ බෙදාහැරීමේදී දෙපාර්තමේන්තුව වෙත එම භාණ්ඩ විධිමත් පරිදි භාර ගැනීමෙන් හෝ ලේඛනගත කිරීමෙන් තොරව

භාණ්ඩ බෙදාහැර තිබුණි. එසේ හෙයින් මෙම පූජා භාණ්ඩ සඳහා ගෙවීම් කිරීමේදී මුදල් රෙගුලාසි 137(5) විධිවිධාන නොසළකා හැර තිබුණි.

(ඇ) ආගමික ආයතනයක් හෝ කිසියම් නියෝජිතයෙකු හෝ පුද්ගලයෙකු හෝ වෙත පූජා භාණ්ඩ ලබා ගැනීමේදී ලිඛිත ඉල්ලීමකින් තොරව භාණ්ඩ ලබා දී තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(ඉ) දෙපාර්තමේන්තුව පූජාභාණ්ඩ මිලදී ගැනීමේදී ඒ සඳහා ලිඛිත සාක්ෂියක් ලෙස භාණ්ඩ මිලදී ගැනීමේ අවසර පත්‍රයක් භාවිතා කර තිබුණු නමුත් එම අවසර පත්‍ර අනුක්‍රමික අංක සහිතව හෝ අනු පිටපත් සහිතව හෝ මුද්‍රණය කර නොතිබුණි. එබැවින් නිකුත් කළ භාණ්ඩ අවසර පත්‍ර නිසි පරිදි දෙපාර්තමේන්තුව වෙත ලැබුණේද යන්න තහවුරු කරගත නොහැකි වූ අතර පූජා භාණ්ඩ සඳහා ගෙවීම් කිරීමේදී භාණ්ඩ අවසර පත්‍ර හා ඉන්වොයිසිවල සඳහන් නිකුත් කරන ලද පූජා භාණ්ඩ පිළිබඳ සැසඳීමක් සිදු නොකර එම ආයතන වලින් ඉදිරිපත් කළ ඉන්වොයිසි මත පමණක් ගෙවීම් කර තිබුණි.

(ඊ) ඉහත සඳහන් භාණ්ඩ නිකුත් කිරීමේ අවසර පත්‍ර පරීක්ෂාවේදී පහත දුර්වලතා නිරීක්ෂණය විය.

(i) බලයලත් දෙපාර්තමේන්තු නිලධාරියකුගේ විධිමත් අනුමැතියකින් තොරව පෞද්ගලික ආයතන විසින් අවසර පත්‍ර රැගෙන යන්නාට පූජා භාණ්ඩ නිකුත් කර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

(ii) එක් එක් පුද්ගලයන් හෝ ආයතන වෙත පූජා භාණ්ඩ බෙදා හැරීමේදී ඒවා නියමිත ප්‍රමාණයෙන් භාරගත් බවට තහවුරු කර ගැනීමෙන් තොරව භාණ්ඩ නිකුත් කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය. ඒ අනුව අදාල පාර්ශවයන් වෙත නිසි පරිදි භාණ්ඩ ලැබුණේද යන්න තහවුරු නොවීය.

(iii) මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත සෘජුවම පූජා භාණ්ඩ ලබා ගෙන ඇති අවස්ථාවල එම භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් සම්බන්ධයෙන් විධිමත් පරිදි ලේඛන හෝ වාර්තා දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

**8.13 කළමනාකරණ දුර්වලතා**
**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**ඉරහඳයාව වත්ත**
**-------------------**

දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන "සිල්වා විජේසේකර " බූදලයට අයත් ඉරහඳයව වත්ත සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් ඌනතාවයන් නිරීක්ෂණය විය.

**(අ)** 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පරිදි අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වී නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(i) වතු අංශයේ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව 2014 වර්ෂයේ ඉරහඳයාව වත්තේ අපේක්ෂිත ලාභය රු.7,391,966 ක් වුවත් තථ්‍ය ලාභය රු.1,394,457 ක් වී තිබුණි. ඒ අනුව තථ්‍ය ලාභය අපේක්ෂිත ලාභයෙන් සියයට 19 ක පමණ ප්‍රමාණයක් වී තිබුණි. .

(ii). 2014 වර්ෂයට පිළියෙල කළ ඇස්තමේන්තුව අනුව අතුරුබෝග වර්ග 2 කින් රු.57,500 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණත්, තථ්‍ය වශයෙන් රු.7,600 ක් පමණක් උපයා තිබුණු අතර, ඇස්තමේන්තු නොකළ අතුරු බෝග වර්ග 3කින් රු.28,944 ක ආදායම් ලැබී තිබුණි.

(ii) පොල් වගාවෙන් 2014 වර්ෂයේදී පොල් ගෙඩි 260,000 ක් ඇස්තමේන්තු කර තිබුණත්, පොලි ගෙඩි 169,074 ක අස්වැන්නක් වාර්තා වී තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු කළ පොල් ගෙඩි ප්‍රමාණයෙන් සියයට 65 ක ප්‍රමාණයක් සාධනය කර ගෙන තිබුණි.

(ආ) ඉරහඳයාව වත්තේ වෙනත් ආදායම් හා අතුරු බෝග වගාව 2012 මාර්තු මාසයට පසු යාවත්කාලීන කර නොතිබීම නිසා අතුරු බෝග වගාව සම්බන්ධයෙන් ලිඛිත තොරතුරු කිසිවක් ප්‍රධාන කාර්යාලයේ නොතිබුණි. ඒ අනුව වගාකර ඇති අතුරු බෝග පිළිබඳ විස්තර, වර්ෂය තුළ ලැබුණු අස්වනු ප්‍රමාණය, ලැබූ අස්වනුවලින් සුභසාධක සංගමය මඟින් විකුණූ ප්‍රමාණය හා එම ගනුදෙනු ගිණුම්ගත කිරිම පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(ඇ) අක්කර 8 ක් පුරා ආදායම් උපදවා ගත හැකි සාර්ථක යටි වගාවක් ලෙස වගා කර තිබුණු කුරුඳු වගාව බලධාරීන්ගේ නිසි අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයේ පොල් ගෙඩි 71,000 ක් බීජ පොල් සඳහා පොල් සංවර්ධන මණ්ඩලයට ලබාදීම මත රු 3,014,600 ක ආදායමක් උපයාගෙන තිබුණි. එහෙත් 2014 වර්ෂය අවසාන වන විට පොල් සංවර්ධන මණ්ඩලයට සපයන පොල් ප්‍රමාණයේ අඩුවීමක් ද 2015 වර්ෂයේ පළමු මුරයේ පොල් සපයා නොතිබුණු බවද නිරීක්ෂණය විය.

(ඉ) 2014 වර්ෂයේ සුභසාධක සංගමය මගින් පොල් විකිණීමේ ආදායම ලෙස රු.114,702 ක් අදාල භාරයේ ආදායමට බැරවිය යුතු වුවත් රු.85,298 ක් පමණක් ආදායමට බැරකර තිබීමෙන් රු.29,404 ක ආදායමක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**8.15 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 06 | 05 | 01 |
| (ii) | ද්විතියික මට්ටම | 02 | 02 | - |
| (iii) | තෘතියික මට්ටම | 46 | 27 | 19 |
| | **එකතුව** | **54** | **34** | **20** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 19ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.